රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 32/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.

1988 සැප්තැම්බර් මස 16 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**1988 රාජ්‍ය සාහිත්‍ය උත්සවය - සැප්තැම්බර් 23, 24, 25**
**අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ සංස්ථා මට්ටමින් සාහිත්‍ය උත්සව පැවැත්වීම**

1988 සැප්තැම්බර් මස 23, 24, 25 යන දිනයන්හි දී රාජ්‍ය සාහිත්‍ය උත්සවය දියතලාවේදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් අවශ්‍ය පියවර ගෙන ඇත. මේ සඳහා දිවයිනේ සියළුම පළාත් සභා, රාජ්‍ය ආයතන, සංස්ථා, පාසල්, පිරිවෙන්, විහාරස්ථාන, ග්‍රාමෝදය මණ්ඩල, ප්‍රාදේශීය මණ්ඩල, යන ආයතනත්, ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රජා සමිති යනාදී පොදු සංවිධානත් සහභාගි කරවා ගැනීමට එකී අමාත්‍යාංශය කටයුතු කර ඇත.

02. මානව භක්තිය ඇති කෙරෙන, උසස් රසඥතාවක් ඇති කරන, හොඳ පොත පත කියවීමට පුරුදු රජයේ ආයතනවල සේවකයන් සේවයේ යාන්ත්‍රික ස්වරූපයෙන් මුදවා ගෙන පොදු ජන සුභ සිද්ධිය සඳහා ඇප කැප වීමට සුදුසු මානව ගුණධර්ම වලින් යුක්ත කරවීමට සාහිත්‍ය මාසය උපයෝගී කර ගැනීම මැනවි යයි එම අමාත්‍යාංශය දන්වා ඇත.

03. රසඥතාව දියුණු කොට, ගුණ නුවණ වැඩීමට කැපවුණු ඔබ ඇතුළු ඔබ ආයතනයන්හි ඇති සමිති සමාගම්, සාහිත්‍ය කෙරේ උනන්දුවක් දක්වන පිරිස ද, මෙම මාසය තුළ සාහිත්‍ය සම්මන්ත්‍රණ, දේශන, තරග, සංස්කෘතික සංදර්ශන පැවැත්වීමේ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙලට සහාය වන්නේ නම් ඉතා වැදගත්ය.

04. මේ සඳහා ඔබගේ ආයතනයේ හෝ ඊට අනුබද්ධව සාහිත්‍ය සංගම් පණගැන්වීමට සංස්කෘතික අමාත්‍යාංශය යෝජනා කරයි. ඒ සඳහා සුදුසු පරිදි සකස් කරගත හැකි ව්‍යවස්ථාවක කෙටුම්පතක් ද මේ සමග ඇත. මේ පිළිබඳව යම් සහායක් අවශ්‍ය වන්නේ නම් සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් අමතන්නේ නම් මැනවි.

05. මෙම චක්‍රලේඛය සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම පරිදි නිකුත් කෙරේ.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්.